කැළණිය විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදි (විශේෂ) උපාධි සිව්වන වසර පරීක්ෂණය (බාහිර)- 2013

2016 - ඔක්තෝබර්

**BCOME 4534 - නූතන කළමනාකරණ භාවිතයන්**

ප්‍රශ්න සංඛ්‍යාව : (හයයි) 06 | කාලය : පැය 03 යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

---

01. අ. ලීන් නිෂ්පාදනය යනුවෙන් හැඳින්වෙනුයේ කුමක්ද ?

(ලකුණු 02)

ආ. ප්‍රයෝගික උදාහරණ සමඟ මුඩා සංකල්පය පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ඇ. පාරිභෝගිකයා හට වටිනාකම් නිර්මාණය කිරීමේදී ව්‍යාපාරයක් විසින් මුඩා සංකල්පය භාවිතා කළ හැක්කේ කෙසේද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ඉ. ජිදොකා සහ මුඩා සංකල්ප අතර වෙනස ප්‍රයෝගික උදාහරණ මඟින් පැහැදිලි කරන්න.

(ලකුණු 08)
(මුළු ලකුණු 02)

02. අ. කෛසන් සංකල්පය නිර්වචනය කරන්න.

(ලකුණු 02)

ආ. ඉන්ධන කර්මාන්තයේදී ඔබට කෛසන් සංකල්පය භාවිතා කළ හැක්කේ කෙසේද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ඇ. සංවිධානයක අඛණ්ඩ දියුණුව සිදුකිරීමේදී මුහුණ පෑමට සිදුවන අභියෝගයන් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ඉ. ප්‍රතිසම්පාදනයේ සහ සැපයුමේ සම්බන්ධතාවයන් වර්ධනය කිරීමේ ශිල්පීය ක්‍රමයක් ලෙස කෛසන් සංකල්පය පැහැදිලි කරන්න.

(ලකුණු 08)
(මුළු ලකුණු 20)

03. අ. 5S සංකල්පය නිර්වචනය කරන්න.

(ලකුණු 04)

ආ. 5S සංකල්පය ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන වාසි මොනවාද ?

(ලකුණු 04)

ඇ. නාස්තිය පිටු දැකීමේදී 5S සංකල්පය කෙසේ උපකාරි වන්නේද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ඉ. 5S සංකල්පය ක්‍රියාත්මක කිරීමේදී කළමනාකරණයේ භූමිකාව සාකච්ඡා කරන්න.

(ලකුණු 07)
(මුළු ලකුණු 20)

04. අ. සමස්ත ගුණත්ව කළමනාකරණය කුමක්ද යන්න නිර්වචනය කරන්න.

(ලකුණු 02)

ආ. ගුණත්වයේ (Quality) මානයන් (Dimensions) කවරේද ?

(ලකුණු 04)

ඇ. මූලික ගුණත්ව පිරිවැයේ ප්‍රභේදයන් උදාහරණ සමඟ පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ඉ. සේවා සපයනු ලබන ආයතනයක සමස්ත ගුණත්ව කළමනාකරණය සම්බන්ධයෙන් ඉහල කළමනාකාරිත්වයේ භූමිකාව පැහැදිලි කරන්න.

(ලකුණු 08)
(මුළු ලකුණු 20)

05. අ. තුලිත ලකුණු පත යනුවෙන් හඳුන්වනුයේ කුමක්ද යන්න නිර්වනය කරන්න.

(ලකුණු 02)

ආ. තුලිත ලකුණු පත ගොඩනැගීමේදී උපායමාර්ගික පදනම යනුවෙන් හඳුන්වනුයේ කුමක්ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ඇ. සමස්ත තුලිත ලකුණු පත ක්‍රියාත්මක කිරීමේ මූලික අරමුණ විවේචනාත්මකව ඇගයීමට ලක් කරන්න.

(ලකුණු 06)

ඉ. ව්‍යාපාරයක තිරසාර බව තුලිත ලකුණු පත මගින් තහවුරු කරනුයේ කෙසේද යන්න සාකච්ඡා කරන්න.

(ලකුණු 08)
(මුළු ලකුණු 20)

06. අ. ඉගෙනුම් සංවිධානයක් ලෙස හැඳින්වෙනුයේ කුමක්ද ?

(ලකුණු 02)

ආ. ඉගෙනුම් සංවිධානයක ලක්ෂණ කවරේද යන්න දක්වන්න.

(ලකුණු 04)

ඇ. ව්‍යාපාර සංවිධානයක ඉගෙනුම් සංස්කෘතියක් පැවතීමේ වාසි කවරේද යන්න දක්වන්න.

(ලකුණු 06)

ඉ. සාම්ප්‍රදායික ව්‍යාපාරයක් ඉගෙනුම් සංවිධානයක් බවට පරිවර්තනය කිරීමේදී මුහුණ පෑමට සිදුවන අභියෝග සාකච්ඡා කරන්න.

(ලකුණු 08)
(මුළු ලකුණු 20)